# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1898/46 - 2015 ජනවාරි මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2015.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ සොරණාතොට ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයේ පුරප්පාඩුව පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන සොරණාතොට ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ, තනතුරු දැරූ සභාපති වන මනමේන්ද්‍ර පටබැඳිගේ ලීලසේන නම් වූ සභාපති අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නාවූ ද, ඒ සොරණාතොට ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලෙක්ම් විසින් නිශ්චිත කාල පරිච්ඡේදය ඇතුළත ස්වකීය තීරණය දැනුම් නොදී ඇති හෙයින් ද ;

සොරණාතොට ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරි රත්නායක රාලලාගේ අසංක සතිස් කුමාර රත්නායක වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, 2011 මාර්තු මස 17 දින සොරණාතොට ප්‍රාදේශීය සභාව සඳහා පැවැත්වූ ඡන්ද විමසීමේදී ඊළඟට වැඩිම මනාප සංඛ්‍යාව ලබා ගත් විජේරත්න ගමගේ නීල් ප්‍රේමතිලක මහතා ඒ පුරප්පාඩුව ඇති වූ සොරණාතොට ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

අසංක රත්නායක,
තේරීම් භාර නිලධාරී,
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 20 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
බදුල්ල.

02 - 164

1A - G 20897— 35 (2015/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ සොරණාතොට ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන සොරණාතොට ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

මනමේන්ද්‍ර පටබැඳිගේ ලීලසේන නම් වූ තනතුරු දැරූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් ඒ සොරණාතොට ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම් සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නිශ්චිත කාල පරිච්ඡේදය ඇතුළත නාම යෝජනා නොකරනු ලැබ ඇති හෙයින් ද ;

සොරණාතොට ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී රත්නායක රාලලාගේ අසංක සතිස් කුමාර රත්නායක වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, 2011 මාර්තු මස 17 දින සොරණාතොට ප්‍රාදේශීය සභාව සඳහා පැවැත්වූ ඡන්ද විමසීමේදී තෝරා පත් කරගත් අවසාන සභිකයා ළඟට වැඩිම මනාප සංඛ්‍යාව ලබාගත් ආර්. එම්. කුමාර සේකර මහතා ඒ පුරප්පාඩුව ඇති වූ සොරණාතොට ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

අසංක රත්නායක,
තේරීම් භාර නිලධාරී,
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 20 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
බදුල්ල.

02 - 165

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.